# උපාධි ප්‍රදානෝත්සවය

# රුහුණ විශ්වවිද්‍යාලය

## 2009 දෙසැම්බර් 16 බදාදා

### රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම සංකීර්ණයේ දී පැවැත්වේ.

වර්ෂ 1978 දී කෘෂිකර්ම,කලා, වෛද්‍ය හා විද්‍යා පීඨ හතරකින් ආරම්භ වූ රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යාතනය, වර්ෂ 1984 දී රුහුණ විශ්වවිද්‍යාලය නමින් පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට උසස් විය. දශක තුනක කාලය තුළ රුහුණ විශ්වවිද්‍යාලයට අති විශාල ප්‍රගතියක් ලබාගැනිමට හැකිවිය. වර්ෂ 1999 දී ඉංජිනේරු පීඨය ගාල්ල හපුගල ප්‍රදේශයේ ස්ථාපනය කල අතර වර්ෂ 2003 දී කළමනාකරණ හා වාණිජ පීඨය ස්ථාපනය කිරීමට සමත් විය. වර්ෂ 2005 දී ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය ස්ථාපනය කෙරුණු අතර ශ්‍රී ලංකාවේ මෙවැනි පීඨයක් සහිත එකම විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය බවට පත්වීමේ ගෞරවය ද ලබා ගන්නා ලදී. වර්තමානයේ රුහුණ විශ්වවිද්‍යාලය පීඨ හතකින් සමන්විත වන අතර, එය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් ප්‍රමුඛතම ස්ථානයක දිදුලන තාරකාවක් බවට පත්ව ඇත. වර්තමානයේ විශ්වවිද්‍යාල සිසුන් 7500 ක් පමණ අධ්‍යයන කටයුතු කරන අතර 455 ක අධ්‍යයන කාර්ය මණ්ඩලයක් හා 813 ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් සේවය කරනු ලැබේ. පසුගිය වසර තිහක කාලය තුළ රුහුණ විශ්වවිද්‍යාලය විසින් බිහි කළ විද්වතුන් විශාල ප්‍රමාණයක් සංවර්ධන ක්‍රියාදාමය කෙරෙහි සක්‍රිය දායකත්වය ලබා දී ඇත. එමෙන්ම වර්තමානයේ හම්බන්තොට දිස්ත්‍රික්කය ජාත්‍යන්තර සංවර්ධන කේන්ද්‍රයක් බවට පත්කිරීමේ කාර්යාවලියට ද සක්‍රිය  දායකත්වයක් ලබා දෙයි.
















**රුහුණ විශ්වවිද්‍යාලයේ දැක්ම**

ඉහළ පාණ්ඩිත්‍යය, අධ්‍යයන නිදහස, නොකිලිටි සදාචාර සාරධර්ම හා සමාජ වගකීම සඳහා කැපවුණු ජාත්‍යන්තර ගෞරවයට පාත්‍ර වු උත්කෘෂ්ට අධ්‍යයන කේන්ද්‍රයක් බවට පත්වීම රුහුණ විශ්වවිද්‍යාලයේ දැක්ම වේ..

**රුහුණ විශ්වවිද්‍යාලයේ නිෂ්ඨාව**

ජාත්‍යන්තරව පිළිගන්නා වූ ද, ශාස්තෝද්ග්‍රහණයට දිවිය පුරා ඇලුම් කරන්නා වූ ද, නව්‍යත්වය. විශ්ලේෂණාත්මකත්වය හා අනුවර්තනය වීමට හැකි බව යනාදී ලක්ෂණයන්ගෙන් හෙබි උත්කෘෂ්ට උපාධිධරයන් බිහි කිරීමත්, ප්‍රාදේශීය ජනතාවගේ අධ්‍යාපන, සංස්කෘතික, ආර්ථික හා ස්වාභාවික පරිසර පෝෂණය කිරීමත්, ඔවුන්ගේ දැනුම අභිවර්ධනයට දායක වීමත්, රුහුණ විශ්වවිද්‍යාලයේ නිෂ්ඨාව වේ..

## පිරිනමනු ලබන උපාධි

| | |
|---|---|
| සම්මාන උපාධි | 02 |
| පශ්චාත් උපාධි | 26 |
| කෘෂිකර්ම විද්‍යාවේදී උපාධි | 102 |
| ශාස්ත්‍රවේදී උපාධි | 371 |
| ඉංජිනෙරු විද්‍යාවේදී උපාධි | 106 |
| ව්‍යාාර පරිපාලනවේදී උපාධි | 267 |
| වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි | 127 |
| විද්‍යාවේදී උපාධි | 368 |

**මෙම උපාධි ප්‍රදානෝත්සවය පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා අන්තර්ජාලය ඔස්සේ සජීවව විකාශය වේ.**
**මේ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසෙන්න (http://www.ruh.ac.lk)**